**ජනතාවාදී ඒකාබද්ධ විපක්ෂය අද (22) කොළඹ මල් පාර දේශපාලන කායර්ාලයේ පැවැත්වූ මාධ්‍ය සාකච්ඡාවේදී හිටපු අමාත්‍ය මහින්ද අමරවීර පළ කළ අදහස්**

අද අපි ප්‍රධාන වශයෙන්ම මේ සාකච්ඡාවට අරමුණු කරගත්තේ වතර්මානයේ ගොවි ජනතාවට ඇතිවී තිබෙන ගැටලු පිළිබඳව කරුණු ඔබ වෙත ඉදිරිපත් කිරීමටයි.

මේ වන විට ගොවි ජනතාව වැඩි ප්‍රමාණයක් ගොවිබිම්වලින් ඉවත් වෙලා පාරට බැහැලා විරෝධතා පවත්වන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. පළමුවෙන්ම කිය යුතු දේ තමයි, ආණ්ඩුව මේ ගොවි සංවිධාන නායකයින්ට ඇඟිල්ල දිගු කරනවා මේ අය මේ විපක්ෂයේ කණ්ඩායම් කියලා.

2024 අපේ ආණ්ඩුව වතර්මාන ආණ්ඩුවට බාර දෙන විට මමයි හිටපු කෘෂිකමර් ඇමතිවරයා. ඒ නිසා මම මේ අයගේ මුහුණු හොඳට අඳුනනවා. ඒ අයගෙන් 80%ක් විතර මම කෘෂිකමර් ඇමති වෙලාවෙත් මට විරුද්ධව යම් යම් දේවල් ප්‍රකාශ කරා වගේම ඒ ආණ්ඩුවේ අඩුපාඩු පෙන්වා දෙමින්, ඒ 75%ක් 80%ක් විතර ගොවි ජනතාවත් ගොවි සංවිධානවල බොහෝ දෙනෙකුත් ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් තමයි කටයුතු කරේ. ඒ අය මාලිමාව වෙනුවෙන් තමයි එදා පෙනී හිටියේ.

මොකද මේ ගොවි සංවිධාන නායකයින් විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණට සම්බන්ධ වෙන්න හේතුව තමයි ඔබ දන්නවා පසුගිය කාලය පුරාවටම ගම් මට්ටමේ තිබුණු සංවිධානවල බලය ජනතා විමුක්ති පෙරමුණ සතු කර ගැනීම සඳහා ඔවුන් දැඩි කැපකිරීමක් කළා. ඒ අනුව සමූපකාරවලට ගියා, ඊට අමතරව මරණාධාර සමිතිවලට, තරුණ සේවා සභාවේ තනතුරුවලට, ග්‍රාම සංවධර්න සමිතිවලට වගේම ගොවි සංවිධානවල බලය අල්ලා ගැනීම සඳහා ඔවුන් අවුරුදු ගණනාවක් තිස්සේ දැවැන්ත උත්සාහයක් දැරුවා. එහි ප්‍රතිඵලයක් විදියට තමයි වැඩි ප්‍රමාණයක් ගොවි සංවිධානවල බලය ඔවුන් සතු කරගත්තේ.

ඒ නිසා මම මේ රජයට පළමුවෙන්ම කියන්න කැමතියි, මේ අද පාරට බැස්ස ගොවි සංවිධාන නියෝජිතයන්, ඒ වගේම ගොවි ජනතාව ඒ අය විපක්ෂයේ කියලා හන්වඩු ගැහීමෙන් ඔවුන්ටම තමයි පාඩුව වෙන්නේ. ඔවුන් ඡන්දය පාවිච්චි කරේ වතර්මාන ආණ්ඩුවට.

ඒ වගේම මේ උද්ඝෝෂණවලට කිසිදු ආකාරයකින් දේශපාලනඥයින් සම්බන්ධ වුනේ නැහැ. බොහොම කලාතුරකින් තමයි දේශපාලඥයෙක් සම්බන්ධ වුණා නම් සම්බන්ධ වුණේ. මොකද මම හිටපු කෘෂිකමර් අමාත්‍යවරයා විදියට මම වගකීමෙන් කියනවා, අද වෙනකන් අපි කිසිම ආකාරයක ගොවි උද්ඝෝෂණයකට නායකත්වය දුන්නෙත් නෑ, අපි සංවිධානය කරෙත් නෑ. ඔවුන් ස්වේච්ඡාවෙන් ඔවුන්ට ඇතිවී තිබෙන ගැටලු පිළිබඳව කරුණු ඉදිරිපත් කිරීමක් තමයි සිද්ධ වුණේ.

ඔවුන්ට තිබෙන ප්‍රශ්නවල බරපතලකම නිසාම ඔවුන් පාරට බහින්න කල්පනා කරා. ඒකට ප්‍රධාන හේතුව තමයි දැන් බලයට පත්වෙලා තිබෙන රජයේ ඉන්න ඇමතිවරු, ඒ අය විරුද්ධ පක්ෂයේ ඉන්න කාලය තුළදී ගොවි ජනතාවට විශාල පොරොන්දු රාශියක් දුන්නා. ඒ වගේම බලාපොරොත්තු රාශියක් ඇති කරා. ඒ නිසා තමයි රුපියල් 40,000ට පොහොර මිටිය තියෙන වෙලාවේ අපි රට භාරගෙන රුපියල් 7,000 ගාණට එනකන් පොහොර මිටියේ මිල අඩු කළේ. නමුත් ඒවා පිළිගන්නේ නැතුව ඡන්දය පාවිච්චි කරන්න ප්‍රධාන හේතුවක් වුණේ මේ ගොවි ජනතාව විශ්වාස කරා අපිට වඩා බොහෝ දේවල් මේ අලුතෙන් පත්වෙන මාලිමා රජය තුළින් ලැබේවි කියලා.

ඔවුන් නිරන්තරයෙන්ම පොහොර මිල සම්බන්ධයෙන් ප්‍රකාශ නිකුත් කළා. ඒ වගේම වී මිල සම්බන්ධව ප්‍රකාශ නිකුත් කළා. ඒ වගේම නවීන තාක්ෂණය ගැනත් ඔවුන් පුන පුනා කිව්වා. සහල් ආනයනය

පිළිබඳවත් ඔවුන් කියපු කතා ටික ඔබට සිහිපත් වෙනවා ඇති. ඒ නිසාවෙන් තමයි ඔවුන් වෙත මේ ගොවි ජනතාව නැඹුරු වුණේ.

දැන් අද වෙනකොට මොකක්ද තියෙන ප්‍රශ්නය? ප්‍රශ්නය ගත්තොත් ඒ අයට තිබුණා පොහොර ප්‍රශ්නයක්. පොහොර ටික හරියට නිසි ආකාරව ලැබුණේ නෑ. ඒ වගේම පොහොර නොමිලේ දෙනවා කිව්වා, මම මේ අවස්ථාවේ සඳහන් කරන්න කැමතියි රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව කාලේ මම කෘෂිකමර් ඇමතිවරයා විදියට අපිට රුසියාවේ පොහොර ලෝක ආහාර සංවිධානය හරහා මෙට්‍රික් ටොන් 55,000ක් නොමිලේ ලබාගන්න පුළුවන් වුණා. එම පොහොර ලබාගත්තේ වී ගොවීන් වෙත දෙවතාවක් නොමිලේ ලබාදෙන්නත්, එළවළු ගොවීන් වෙත නොමිලේ එක වතාවක් ලබාදෙන්නත්.

අපි එහෙම තමයි පොරොන්දු වුණේ. නමුත් වී ගොවීන් වෙත එක වතාවක් පමණයි මේ පොහොර ලබාදුන්නේ. මොකද ඒවා බෙදන අතරතුර තමයි ආණ්ඩු මාරුව සිදුවුණේ. ඒ නිසා ගෙනාපු ප්‍රමාණයෙන් භාගයකටත් අඩු ප්‍රමාණයක් විතරයි අපිට බෙදන්න හැකියාව ලැබුණේ. අනිත් පොහොර ටික දැන් කොහේ තියෙනවාද කියලා හොයාගන්නවත් බෑ.

ඒවා පොල් වගා කරන අය වෙනුවෙන් ලබාදෙනවා කිව්වා, තව තව දේවල් කිව්වා. නමුත් නොමිලේ දීපු තැනක් පිළිබඳව අපිට සොයාගන්න බැහැ. නමුත් පසුගිය දවස්වල එම පොහොර තොගයක් පොහොර කලවම් කරන තැනක තිබිලා නම් අහුවුණා. ඒ වගේ තැන් තුන හතරක තිබිලා අහුවෙලා තියෙනවා.

ඒ පිළිබඳව ඇත්තටම හෙළිදරව් කරේ මේ රටේ තියෙන අපරාධ පරීක්ෂණ දෙපාතර්මේන්තුවවත් නැත්නම් පොලිසියවත් නෙමෙයි, හිරු නාලිකාවේ CIA වැඩසටහනින් තමයි ඒ හෙළිදරව්ව කළේ. තවත් ඒ වගේ තැන් ගණනාවක පොහොර තිබෙන බවට අපිටත් තොරතුරු ලැබෙමින් පවතිනවා. අපි කියනවා මේ පරීක්ෂණ අඛණ්ඩව කරගෙන යන්න.

මේ පිළිබඳව රජය ස්වාධීන පරීක්ෂණයක් කරලා ඒ තොරතුරු රටට හෙළි කරයි කියලා අපි හිතනවා, ඒ වගේම ඒ අදාළ අයට දඬුවම් ලබාදෙයි කියලා අපි විශ්වාස කරනවා. දැනටමත් කීපදෙනෙක් අත්අඩංගුවට අරගෙන තියෙනවා. අත්අඩංගුවට අරගෙන තියෙන්නේ පහළ මට්ටමේ නිලධාරීන්. මේකට ඉහළ මට්ටමේ නිලධාරීන්ගේ සම්බන්ධතාවයක් තියෙනවා කියලා යම් යම් තොරතුරු තියෙනවා. ඒ අයට එරෙහිවත් කටයුතු කරන්න කියන ඉල්ලීම අපි කරන්න කැමතියි.

ඒ වගේම තමයි දැන් අද තිබෙන මේ වී මිලේ ප්‍රශ්නය. මේ වී මිල සම්බන්ධව කිව්වොත් ඒක දැන් ගිය කන්නේ ගත්තා 120ට නාඩු කිලෝ එක. එතකොට 120ට ගන්න මිලට වැඩිය දැන් මේ වෙලාවේ අනිවායර්යෙන් වැඩි විය යුතු හේතු ගණනාවක් තියෙනවා. ඒ තමයි පොහොර මිටිය රුපියල් 17,000ට විතර වැඩි වුණා, දෙගුණයකට විතර වැඩි වුණා. ඒ වගේම ඉන්ධන මිල වැඩිවීමේ ප්‍රතිඵලය විදියට සීසෑමේ ගාස්තුව විශාල විදියට වැඩි වුණා. ඒ වගේම ගොයන් කපන්න යන ගාස්තුවත් විශාල විදියට වැඩි වුණා. ඒ වගේම කෘමිනාශක ගාස්තුවත්, ඒ වගේම අනිත් පැත්තට කුලීකරුවන්ගේ ගාස්තු ඇතුළු සියලු වියදම් වැඩිවීම නිසා අනිවායර්යෙන්ම ගිය වතාවට වඩා වැඩි මිලක් ලබාදීමේ වගකීම මේ රජයට තියෙනවා.

ඒ වගේම තමයි දැන් රජයේ අමාත්‍යවරු කියන්න අරගෙන තියෙනවා, දැන් ඒ අය විරුද්ධ පක්ෂයේ ඉඳපු කතා පිළිබඳව යම් යම් සාවද්‍ය තොරතුරුත් ඉදිරිපත් කරනවා. මං කැමතියි මේ වෙලාවේ පොඩි වීඩියෝ එකක් ඔබට කෙටියෙන් පෙන්නන්න. ඒ තමයි මේ වතර්මාන නියෝජ්‍ය ඇමතිතුමා කියනවා නාමල් කරුණාරත්න, එයා 154 ගාණේ කිව්වේ රුපියල් 40,000ට පොහොර තියෙන වෙලාවේ කියලා. රුපියල් 154 වී මිලක් ඔහු ඉල්ලුවා, ඉල්ලුවේ රුපියල් 40,000 පොහොර මිල තියෙන වෙලාවේ ඊට පස්සේ

නෙවෙයි කියලා. මම කියන්න කැමතියි ඔහු මේ මිල ඉල්ලුවේ මම කෘෂිකමර් ඇමති වෙලාවේ. එතකොට පොහොර මිල රුපියල් 8,000ට විතර තිබුණේ.

මඩ පොහොර ටික නොමිලේ දුන්නා, ඉන්ධන නොමිලේ දුන්නා, ඒ කන්නේ නොමිලේ ලබාදුන්න චීනෙන් අපිට ලැබිච්ච ඉන්ධන සහනාධාර, ඒ වගේම කුඩා ගොවීන් සඳහා යූරියා නොමිලේ ලබාදුන්නා. සමහර එක කණ්ඩායමකට, කුඩාම කණ්ඩායමකට බීජ වී නොමිලේ ලබාදෙන වැඩසටහන් තිබුණා. ඒ ක්‍රියාත්මක වෙච්ච වෙලාවෙත් 154ට ඉල්ලනවා නම්, 154ක් වියදම යනවා කියලා 150කවත් මිලක් ඉල්ලනවා නම්, අද වෙනකොට කීයක මිලක් ඉල්ලිය යුතුද?

ඒ වගේම අර පොළොන්නරුවේ රාජ්‍ය නායකයා කිව්වා අපිට මෝල් ගෙනල්ලා හයි කරන්න බෑ, අපිට මේක කෙටි කාලෙකින් කරන්න බෑ කියලා. ඔබ දකින්න ඇති, ඔබේම මාධ්‍ය ආයතන වලින් ඒවා ප්‍රචාරය වුණා. අපි ඊළඟ සැරේ ඉඳලා හාල් කොටලා සතොස හරහා අඩුවට දෙනවා කිව්වා අපේ මෝල් වලින්, ඒ තිබිච්ච මෝල් ටිකෙන්. ගොඩක් ඒවා විනාශ වෙලා තිබුණා, තිබිච්ච මෝල් ටික බලලා ගබඩා ටික නවීකරණය කරනවා කිව්වා, ගබඩා අලුතෙන් හදනවා කිව්වා. දැන් අවුරුදු දෙකකට ආසන්න කාලයක් ගිහිල්ලා තියෙනවා. හදපු වී මෝලකුත් නෑ, හදපු ගබඩාවකුත් නැති බව තමයි පෙනෙන්න තියෙන්නේ.

අනිවායර්යෙන්ම ඔවුන්ට මේ අවුරුදු දෙකක කාලය ඇතුළත අවශ්‍යතාවය තිබුණා නම් මෝල් කීපයක් දාන්න තිබුණා, අලුතෙන් පටන් ගන්න තිබුණා. මොකද දැන් තියෙන තාක්ෂණය අනුව වී මෝලක් පටන් ගන්න මේ අවුරුදු හතරක් පහක් අවශ්‍ය නෑ. ඉතාමත් කඩිනමින් කරන්න පුළුවන්. අඩුම ගානේ වී මෝල් දෙක තුනක්වත් දාලා තිබුණා නම් ගොවියාට යම් සාධාරණයක් සහ පාරිභෝගිකයාට සාධාරණයක් ඉෂ්ට කරන්න තිබුණා. අද ගොවියාට සාධාරණයක් ඉෂ්ට වෙන්නෙත් නෑ, ඒ වගේම පාරිභෝගිකයාටත් සාධාරණයක් ඉෂ්ට වෙන්නේ නෑ.

ඒ වගේම මේ වී මිල මේ තරම් අඩු වෙන්න හේතුව මොකක්ද? සාමාන්‍යයෙන් ගොයන් කැපෙන කාලෙට තමයි වී මිල අඩු වෙන්නේ. මේ සැරේ වී මිල අඩු වුණේ ගොයන් කැපිලා ඉවර වුණාට පස්සේ. ඒකට ප්‍රධාන හේතුව තමයි හාල් ආනයනය කිරීම. මං හිතන්නේ නැහැ මෑත කාලෙක මම දන්න විදියට මොන ආණ්ඩුවක්වත් මේ තරම් හාල් ප්‍රමාණයක් ගෙනාවේ නැහැ.

දැන් ඒකට මොකක්ද වුණේ? කීරි සම්බා, කීරි පොන්නි ගේනවා කියලා විවිධ හාල් වගර් ගෙනල්ලා අද වෙළඳපොලේ ඒ හාල් ටික තියෙනවා. ඒක නිසා මොකද වුණේ? මේ වී ගොවියාට වී ටික විකුණගන්න බැරි වුණා. මෝල්කාරයෝ මගහැරලා ගියා, ආණ්ඩුවත් මගහැරලා ගියා. අද වෙනකොටත් ගිය කන්නේ වී විශාල ප්‍රමාණයක් ගොවීන් ගාව තියෙනවා. ඒ වගේම මේ කන්නෙත් වී මිලදී ගැනීම සඳහා හරි සැලැස්මක් නැහැ.

දැන් මේගොල්ලෝ මෝල් හිමියන්ට පාඩමක් උගන්වන්නනේ කතා කරේ. ඒ වී මෝල් මාෆියාව නවත්වනවා කිව්වේ එක පැන් පාරෙන්. පැන් පාරෙන් පාලනය කරපු බවක් නම් අපිට පෙනෙන්න නැහැ. තවමත් මෝල් හිමියෝ ලස්සනට ජීවත් වෙනවා වගේම හොඳට ශක්තිමත් වෙලා තියෙනවා. වාහන ගේනවා, හෙලිකොප්ටර් ගේනවා, ප්‍රශ්නයක් නැහැ අපිට ඊෂ්‍යාර්‍යාවක් නැහැ. නමුත් ගොවියාට අද මේ කිසිවක් කරගන්න බැරි තත්ත්වයකට පත්වෙලා තියෙනවා.

ඒ නිසා අපි මේ රජයෙන් ඉල්ලන්නේ වහාම මේ සඳහා ජනාධිපතිවරයා මැදිහත් වෙන්න. අපි කියන්නේ නැහැ මේ ආණ්ඩුව පෙරලනවා කියලා. අපි කියන්නේ ඒ අය භාරගත්තු ආණ්ඩුවේ වෙච්ච පොරොන්දු

ටික ඉෂ්ට කරලා දෙන්න කියලා, අපි කියන්නේ මේ ආණ්ඩුව පාලනය ගෙනියන්න, හැබැයි වැරදි විදියට නැතුව හරි විදියට ගෙනියන්න කියලා.

**මෙහිදී අදහස් දැක්වූ පා.ම දයාසිරි ජයසේකර**

ඇත්තටම ජනතා විමුක්ති පෙරමුණේ සටන් භූමිය තමයි ගොවිබිම. ගොවිබිමෙන් තමයි සටන පටන් ගත්තේ. එයින් තමයි පාරට බස්සලා, ජනතාව පාරවල්වලට බස්සලා, මේ ආණ්ඩුව, තිබුණ ආණ්ඩුව පෙරළන්න අවශ්‍ය කරන කටයුතු ටික කළේ.

දැන් අද එහෙම කියපු අයම, ඔබ දන්නවා මුලින්ම ජනාධිපතිවරයා මේසෙට තට්ටු කරලා රුපියල් 10ක් වැඩි කරලා, තමන් හාල් මාෆියාව ඉවත් කරනවා කියලා, එක පැන පහරින් ඉවත් කරනවා කියලා ආපු අය රුපියල් 10කින් මේ හාල් මෝල් හිමියන්ට තමන්ගේ වී ටික, නැත්නම් හාල් ටික විකුණන්න අවශ්‍ය කරන වැඩකටයුතු ටික සකස් කරලා දුන්නා.

ඊළඟට දෙවැන්න, රුපියල් 150ට හාල් ගන්නවා කියලා තමයි කිව්වේ. ජනාධිපතිතුමා මට මතකයි දෙහියත්තකණ්ඩියේ තිබ්බ්ච රැස්වීමකට එනකොට 150යි, ඊට වඩා අඩු නැහැයි කියලා කිව්වේ. ඒ එනකොට ඒ කියපු කාරණය දැන් අද වෙනකොට 120, 130, 140ට යනකල් විශේෂයෙන්ම නාඩු, සම්බා, කීරි සම්බා, රුපියල් 120ට නාඩු, 130ට සම්බා, 140ට කීරි සම්බා ගන්න විදියේ වැඩපිළිවෙලක් හදලා තියෙනවා.

නමුත් ලංකාවේ 2%යි ආණ්ඩුව අද මිලදී ගන්න වැඩපිළිවෙල සකස් කරලා තියෙන්නේ. ලංකාවේ 100%ක් තියෙනවා නම් වී නිෂ්පාදනය, එයින් 2%ක් තමයි මේ ආණ්ඩුව අරගන්න හදන්නේ.

ඇත්ත වශයෙන්ම ප්‍රධානම අබර්දය තියෙන්නේ මෙන්න මේ කාරණය. එක පැත්තකින් ආණ්ඩුව මිලදී ගන්න ප්‍රමාණය, ඒ වගේම මිලදී ගත්ත ප්‍රමාණය අනුව දැන් හාල් මෙට්‍රික් ටොන් ගණනාවක් තිබෙනවා ආණ්ඩුවේ වී මෝල් නැත්නම් ගබඩාවල. මේ ගබඩාවල තිබ්බ්ච වී මෝල්වල, තිබ්බ්ච වී ටික හාල් කරලා, මේ වෙලාවේ ඉස්සෙල්ලාම මේ අස්වැන්න නෙලන්න කලින් වෙළඳපොළට ඉදිරිපත් කරා නම්, ඇත්ත වශයෙන්ම එක පැත්තකින් ලංකාවේ මේ ආණ්ඩුව තුළ තිබ්බ්ච ගබඩා ටිකත් හිස් වෙනවා එක පැත්තකින්, දෙවනුව අඩු මිලකට වීවලින් කොටපු ඒ හාල් ටික වෙළඳපොළට නිකුත් කරන්න තිබුණා.

මේක තියෙද්දි මොකක්ද කළේ, වසන්ත සමරසිංහ මහත්මයා 1,57,000ක් මෙට්‍රික් ටොන් ලංකාවට ආනයනය කරා. දැන් ආනයනය කරායින් පස්සේ, දැන් එක පැත්තකින් ආණ්ඩුව මිලදී ගත්ත වී ටික තියෙනවා, ඒක දිර දිරා යනවා. ඊළඟට ආණ්ඩුව හරියටම අස්වැන්න නෙලනකොටම ගෙනැල්ලා මෙට්‍රික් ටොන් 1,57,000ක් පාරිභෝගිකයන්ට නැත්නම් වෙළඳපොළට අතහැරියා. ඒකත් එක්ක සිද්ධ වෙලා තිබුණේ හාල් මිල යම් කිසි ප්‍රමාණයකට අඩු වීම.

දැන් වී මිලදී ගැනීමේ ක්‍රමවේදය ගත්තයින් පස්සේ, අද රුපියල් 75යි, 80යි, 85ට වැටිලා තියෙනවා වී මිලදී ගැනීම ග්‍රාමීය මට්ටමේ තියෙන සෑම ගමකම තිබෙන තත්ත්වය මේකයි.

ඉතින් ඒ නිසා දැනට විශාල ප්‍රමාණයක්, මං හිතන්නේ රටේ ජනතාව විදිහට ගත්තයින් පස්සේ ඔවුන් තබාගෙන තිබෙනවා වී තොග රැස් කරගෙන ඉන්නවා. එතන තිබෙනවා ඇත්ත වශයෙන්ම 2026 යල කන්නයේ විශේෂයෙන් අපේක්ෂිත මෙට්‍රික් ටොන් ලක්ෂ 18ක් සාමාන්‍යයෙන් අපේක්ෂිත වී අස්වැන්න

තියෙනවා. ඒ වගේම 2025 මාස් කන්නයේ අලෙවි කරගත නොහැකිව තිබෙන වී මෙට්‍රික් ටොන් ලක්ෂ පහත් හතත් අතර ප්‍රමාණයක් රටේ ගොවි ජනතාවගේ ගෙවල්වල දැන් ඔවුන් ගබඩා කරගෙන තියාගෙන ඉන්නවා.

ඒ සියල්ලම එකතු කරපුවාම, මේ දෙකන්නයේම එකතු කරපු වී මෙට්‍රික් ටොන් ලක්ෂ 24ත් 25ත් අතර ප්‍රමාණයක් දැන් ගබඩාවලත් ඒ වගේම අනෙක් පැත්තෙන් ගොවීන් අතරත් තියෙනවා. දැන් මේක තියෙද්දි තමයි, මේ සියල්ලම තියෙද්දි තමයි ආණ්ඩුව මෙට්‍රික් ටොන් 1,57,000ක් ගෙනැල්ලා මේ ව්‍යාපාරයට දැන් මේ වැඩේ කළේ.

දැන් මේකත් එක්ක මොකක්ද දැන් සිද්ධ වෙලා තියෙන්නේ? දැන් එක පැත්තකින් ආණ්ඩුවට අවශ්‍යතාව තියෙනවා තමන්ගේ වී ගබඩා හිස් කරගන්න. දැන් මං දැක්කා ගිය සතියේ විශේෂයෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවීන් ගිහිල්ලා වී ටික අරන් ගියාම, වී අර තිබෙන ගබඩාවේ ඉඩ නැහැ වී ගබඩා කරගන්න, මොකද ඒක පිරිලා දැන් තියෙන්නේ. ඒ නිසා දැන් භාරගන්න බැහැයි කියලා ඔවුන්ව ආපහු හැරෙව්වා.

දැන් එතකොට ආණ්ඩුවට දැන් උවමනා වෙලා තියෙනවා මේ වී ටික දැන් කොහොම හරි මොනවා හරි විදියකට, සත්ව ආහාරවලට හරි මේක දෙන්න. එක පැත්තකින් ජනාධිපතිතුමා, මම දන්නේ නැහැ ජනාධිපතිතුමාට කවුද මේ උපදෙස දුන්නේ කියලා, ජනාධිපතිතුමා ගිහිල්ලා කිව්වා මේ බියර් හදන්න මේ වී පාහලා ගන්න හාල්වලින් මේ ව්‍යාපාරය තුළ ගන්න පුළුවන් කියලා.

දැන් ලංකාවේ නීතිය තියෙන්නේ සුරාබදු ආඥාපනතේ, බොහොම පැහැදිලිව තියෙනවා සුරාබදු ආඥාපනතේ අංක දෙක, නැත්නම් දෙවන වගන්තිය අනුව මේ බියර් හදන්න පුළුවන් වෙන්නේ මෝල්ට්වලින්. හාල්වලින් බියර් හදන්න පුළුවන් කියලා කොහෙවත් එකකින් නැහැ. එහෙනම් එහෙම කරනවා නම් පැහැදිලිව ලංකාවේ නීතිය, සුරාබදු ආඥාපනත උල්ලංඝනය කරලා තමයි වීවලින් නැත්නම් විශේෂයෙන් හාල්වලින් හදන්න පුළුවන් වෙන්නේ මේ බියර් නිෂ්පාදනය කිරීම සඳහා.

දැන් ඒ නිසාම, දැන් මොකක්ද කරලා තියෙන්නේ? මම දන්නේ නැහැ ඉස්සරහට වෙනකොට සුරාබදු ආඥාපනත වෙනස් කරයිද කියලා. මොකද හේතුව, හාල්වලින් බියර් හදපුවාම තිබෙන තත්ත්වය තමයි ඒකේ තියෙන මෝල්ට් ගතිය අඩු වීම නිසා අර කොලිටිය එන්නේ නැහැ බියවර්ල. ඒ වගේම විශේෂයෙන්ම දියවැඩියාව වගේ රෝගවලට භාජනය වෙන්න පුළුවන් අවස්ථාව වැඩියි මේ ක්‍රියාදාමයත් එක්ක.

ඒ නිසා දැන් මොකද කරන්න හදන්නේ? මේ තිබෙන වී, තමන් එකතු කරගත්ත මෙට්‍රික් ටොන් ප්‍රමාණය සම්පූර්ණයෙන්ම සත්ව ආහාරවලට හෝ නැත්නම් බියර් නිෂ්පාදකයන්ට විකිණීම සඳහා වන ක්‍රියාවලියක් ආරම්භ කරන්න වැඩපිළිවෙල සකස් කරලා.

එතකොට දැන් වෙලා තියෙන ප්‍රශ්නය තමයි, රුපියල් 120ට ගත්ත වී රුපියල් 90ට විතර ඊළඟට මේක හදලා මේ සත්ව ආහාරවලට විකුණන්න වැඩපිළිවෙලක් දැන් සකස් කරලා තියෙනවා. දැන් උදාහරණයක් ගත්තොත්, මෙතන තිබෙනවා අපේ මහින්දානන්ද මහත්තයත් මේ ගැන ඉතාම හොඳින් දන්නවා කෘෂිකමර් ඇමති කාලේ, මේ සත්ව ආහාර නිෂ්පාදනය වෙනුවෙන් බඩඉරිඟු ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවලා තියෙනවා ලේකම්, කෘෂිකමර්, ගොවිජන සම්පත්, ඉඩම් හා වාරිමාගර් අමාත්‍යාංශයේ ලේකම්වරයා.

දැන් මේ මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක් විතර ආනයනය කරන්න, බඩඉරිඟු ආනයනය කරන්න වැඩපිළිවෙල සකස් කරලා තිබුණා. විශේෂයෙන්ම මං ඊළඟට එන්නම් ඒ කාරණයට, මොකද විශේෂයෙන් කුකුළු ගොවීන් කුකුළන්ට කෑම ටික දාගන්න බැරුව විශාල අබර්ුදයක ඉන්නවා. ඒ නිසා ඒකට අවශ්‍ය කරන බඩඉරිඟු මෙට්‍රික් ටොන් ලක්ෂ තුනක් ආනයනය කරන්න අවසර දෙන්න කියලා ඔවුන් ඉල්ලීමක් කරලා, ඒකට අවශ්‍ය කරන වැඩපිළිවෙල සකස් කරලා තියෙද්දී, එක පාරට ආණ්ඩුවෙන් මේක ආනයනය කිරීම සම්පූර්ණයෙන් නතර කරනවා සත්ව ආහාර නිෂ්පාදනය වෙනුවෙන් බඩඉරිඟු ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීම තාවකාලිකව අත්හිටුවනවා කියලා 2026.06.30.

දැන් මේක කරපුවාම මොකද වෙන්නේ? දැන් මේකෙන් කරන්න හදන්නේ එක පැත්තකින් මේ සත්ව නිෂ්පාදනයට අවශ්‍ය කරන, විශේෂයෙන් කුකුළන්ට අවශ්‍ය කරන කෑම ප්‍රමාණය හදාගන්න ඇත්ත වශයෙන්ම වැඩියෙන්ම ඔවුන් පාවිච්චි කරන්නේ බඩඉරිඟු. ඇත්ත වශයෙන්ම සහල් පාවිච්චි කරන්න පුළුවන් යම් කිසි ප්‍රමාණයකට පමණයි. මොකද ඒකේ තියෙන ජීව ගුණය රැකගන්න බැරි තැනකට මේක තල්ලු වෙලා තිබෙනවා.

විශේෂයෙන් මේ ක්‍රියාදාමය තුළ මෙට්‍රික් ටොන් ලක්ෂ 10ක විතර ප්‍රමාණයක් තියෙනවා කියලා තමයි අපිට තියෙන ආරංචිය, මේ ආණ්ඩුව එකතු කරගත්ත වීවල ප්‍රමාණය. එතකොට හාල්වලින් පමණක් මේක හදන්න බැරි නිසා රුපියල් 160කට, 65කට ගිය සතියේ කිලෝ එක තිබුණේ මේ බඩඉරිඟුවල, දැන් මේක 210ටත් හොයාගන්න බැරි තැනකට ලංකාව තුළ පත් වෙලා, අද බඩඉරිඟු කිලෝ එකක් හොයාගන්න බැරි තැනකට දැන් තල්ලු වෙලා තියෙනවා.

මේකත් එක්ක දැන් මොකද වෙලා තියෙන්නේ, බිත්තර නිෂ්පාදනය සම්පූර්ණයෙන්ම, දිනකට ලක්ෂ 95ක තිබිච්ච බිත්තර නිෂ්පාදනය අද බිත්තර ලක්ෂ 75කට, 80කට අඩු වෙලා තිබෙනවා. මේකත් එක්ක දැන් සිද්ධ වෙලා තියෙන කාරණය තමයි එක පැත්තකින් අර බඩඉරිඟු ගෙන්වීම නතර කිරීමත් එක්ක රුපියල් 210ට විතර කිලෝ එක ගියායින් පස්සේ, ඇත්ත වශයෙන්ම දැන් ඒ ගාණට හොයාගන්නත් නැති නිසා බිත්තරවල ගාණ දැන් වැඩි වෙලා තියෙනවා. රුපියල් 50කට විතර බිත්තරයක් යයි කියන තත්ත්වය තමයි දැන් අපිට තිබෙන්නේ එක පැත්තකින්.

එතකොට මේ සියල්ලටම හේතු වුණේ වෙන හේතුවක් හින්දා නෙමෙයි, ආණ්ඩුව නිසි කලට ගබඩා කරගත්ත වී ටික, නිෂ්පාදනය කරපු වී ටික කොටලා වෙළඳපොළට ඉදිරිපත් කරන්නේ නැතුව, වාසිය තකා තමන්ට වසන්තය උදා කරගැනීම සඳහා පිටරටවල්වලින් හාල් ගෙනැල්ලා රට ඇතුළට දැම්මයින් පස්සේ තමයි මේ ප්‍රශ්නය දැන් අද උද්ගත වෙලා තිබෙන්නේ.

## මෙහිදී අදහස් දැක්වූ හිටපු රාජ්‍ය අමාත්‍ය අජිත් මාන්නප්පෙරුම

එදා, "මඩ සෝදාගත් ගොවියා රජකමට සුදුසුයි" කියන විරුදාවලිය තමයි තිබුණේ. ඒ කියන්නේ ගොවියාට ඒ තරම් ගෞරවයක් දුන්නා, රජවරුන්, පහුගිය පාලකයින් පවා ගොවියාට මේ ගෞරවය ලබාදුන්නා. නමුත් අද වෙනකොට මඩ සෝදාගත් විට රජකමට සුදුසුයි කියන ගොවියා අද කසිප්පුකාරයෙක් බවට පත් කරලා. ඒක තමයි පුනරුද ආණ්ඩුවේ සිස්ටම් චේන්ජ් (System Change) එක.

මඩ සෝදාගත් කල රජකමට සුදුසුයි කියන ගොවියා අද වෙනකොට හිඟමනයට පත් වෙලා තියෙනවා. මොකද අපි දන්නවා ගොවි උද්ඝෝෂණ වලට එක්වෙච්චි මාලිමාවේ ආණ්ඩුවේ අද ඉන්න ඇමතිවරු එදා මොනවාද කිව්වේ මේ උද්ඝෝෂණයට ඇවිල්ලා, "ගොවියාට රුපියල් 150ක් කිලෝ එකට දෙන්න ඕනේ"

කියලා තමයි කතා කළේ. නමුත් අද ඒවා අමතක වෙලා, අද ගොවියාගේ කරපිටින් බලයට ආපු ආණ්ඩුව අද ගොවියාව අමතක කරලා ගොවියාව කසිප්පුකාරයෙක් බවට පත් කරලා තියෙනවා.

ඒ වගේම අපි දන්නවා වතර්මානයේ වෙනකොට ගොවියා කොච්චර අසරණ වෙලාද? මං හිතන්නේ ඉතිහාසයේ මෙහෙම කවදාවත් අසරණ වෙලා නැහැ. දැන් ගොවියාගේ ගෙදර තියෙන පරණ පුටු ටික, පරණ ඇඳන් පවා මූල්‍ය ආයතන වලින් ඇවිල්ලා වෙන්දේසි කරන තත්ත්වයකට පත් වෙලා. ඒ තරමට ගොවි ජනතාව අසරණ තත්ත්වයකට පත් වෙලා තියෙනවා. ඒ හින්දා අපි කියනවා, ඉතිහාසයේ කවදාවත් ඇදලා නැති නපුරු තැනකට ගොවි ජනතාව මේ රජය විසින් ඇද දමා තිබෙනවා.

හැබැයි එදා මෝල් හිමියෝ ජනාධිපතිතුමාත් එක්ක කතා කරනකොට එක තට්ටුවයි මේසෙට ගැහුවේ, හාල් මිල වැඩි කළා. අන්තිමට මෝල් හිමියෝ නතර වුණේ කෝටි 50, 60 වාහන අරගෙන හෙලිකොප්ටර් වලට ඇණවුම් දීලා. නමුත් ගොවියා අන්තිමට ඇඳෙන් පැදුරට වැටිච්ච තත්ත්වයට තමයි පත් වුණේ.

## මෙහිදී අදහස් දැක්වූ හිටපු පා.ම. අසංක නවරත්න

ගොවි ජනතාව මහ පාරට බැහැලා තමන්ගේ අස්වැන්න විකුණගන්න බැරුව අසරණ වෙලා ආපහු පාරේ උද්ඝෝෂණය කරන්න, තමන්ගේ හඬ අවදි කරන්න පටන් අරන් තියෙනවා. ඉතින් මං හිතන්නේ පහුගිය කාලය පුරාම මාධ්‍ය බලාගෙන හිටපුවාම අපිට ඇත්තටම කණගාටුයි, අපේ ආණ්ඩු තියෙන වකවානුවල වතර්මාන පාලකයින්, විශේෂයෙන්ම අපේ කෘෂිකමර් ඇමතිතුමා, ඒ වගේම විශේෂයෙන්ම අපේ කෘෂිකමර් නියෝජ්‍ය ඇමතිතුමා නාමල් කරුණාරත්න මැතිතුමා ගොවිබිම් වලමයි හිටියේ.

මඩ ගාගෙන, ගොයන් කාගෙන, ගොවි ජනතාවට ගොවිබිම්වල ඉන්න දුන්නේ නැහැ, ඒ අය ගෙනැල්ලා මහ පාරේ උද්ඝෝෂණ තියලා, ඒ තිබුණු ආණ්ඩු වට්ටන්න, ඒ තිබුණු ප්‍රශ්න ගැන කතා කරන්න ගොවි ජනතාව විශාල වශයෙන් ඒකරාශී කරගනිමින් අරගල කරපු කණ්ඩායම්.

ඒ උදවිය ඒ කාලේ කියපු කාරණා අපි හොඳටම දන්නවා. එක වෙලාවක කිව්වා 154ක් වැය වෙනවා කිව්වා වී කිලෝවක් නිෂ්පාදනය කිරීම සඳහා. හැබැයි වතර්මානයේ කෘෂිකමර් නියෝජ්‍ය ඇමතිතුමා දැන් කියනවා, ඒ 154 කිව්වට දැන් එච්චර වියදමක් යන්නේ නැහැ කියලා. ප්‍රායෝගිකව අපි හැමෝම දන්නවා අපේ හැම වියදමක්ම මේ අවුරුදු කීපය තුළ වැඩි වෙලා තියෙනවා.

ඉන්ධන මිල වැඩි වෙලා තියෙනවා, අපේ ගොවිබිම්වල වැඩ කරන ජනතාව වෙනුවෙන් අපි ගෙවන වේතනය වැඩි වෙලා තියෙනවා, ඒ වගේම පොහොර මිල වැඩි වෙලා තියෙනවා, අනෙකුත් සියලුම දේවල් වැඩි වෙලා තියෙන මොහොතක එතුමා කියනවා වී කිලෝවක් නිෂ්පාදනය කරන්න වැය වෙන මුදල වැඩි වෙලා නැහැ, අඩු වෙලා තියෙන්නේ කියලා. ඉතින් ඒ නිසා මං හිතන්නේ ඒගොල්ලෝ බලය ලබාගන්න කප්පරක් බොරු කිව්වා.

බොරු දහස් ගණන් කියල තමයි ඔවුන් ආණ්ඩු බලය ලබාගත්තේ. දැන් තමන්ගේ බලය රැකගන්න තවත් බොරු කියමින් මේ ගොවි ජනතාව පාරට බස්සන යුගයකට පත් වෙලා තියෙනවා. ඉතින් මං හිතන්නේ ගොයන් කාපු නියෝජ්‍ය ඇමතිතුමාට අද අපේ ගම් පළාත් වල යන්න විදිහකුත් නැහැ.

ගොවි ජනතාව හමුවෙන්න විදිහක් නැහැ, ගමේ උත්සවයකට යන්න විදිහක් නැහැ, මලගෙදරකවත් රෑ වෙලා යන්නේ නැහැ, උදේ පාන්දර ගොඩවෙලා තමයි එන්නේ. එහෙම මලගෙවල් වල යන

සංස්කෘතියකුත් නැහැ, අපි තමයි තවමත් යන්නේ. ඉතින් ඒ ගියත් උදේ පාන්දර තමයි යන්නේ. මොකද මහජනතාව ඒකරාශී වෙන තැන් වලට දැන් ඒගොල්ලන්ට යන්න විදිහක් නැහැ.

ඉතින් මං හිතනවා, මේ ඉතිහාසය පුරාම රජ දවසේ ඉඳලම ගොවියාට ලොකු සැලකිල්ලක් තිබුණා. අද වෙනකොට ගොවි පුතෙක් රජ වෙලා, ගොවි පුතෙක් කෘෂිකමර් ඇමති වෙලා, ගොවි පුතෙක් පාරිභෝගික කටයුතු ඇමති වෙලා, ගොවි පුතෙක් කෘෂිකමර් නියෝජ්‍ය ඇමති වෙලා ඉන්න ආණ්ඩුවක ගොවියාට ලැබෙන සැලකිල්ල ගැන ඊයේ දවසේ අපි දැක්කා සියඹලාණ්ඩුව ප්‍රදේශයේ මේ තමන්ගේ ප්‍රශ්න ගැන කතා කරන ගොවි නායකයින්ට ප්‍රාදේශීය දේශපාලඥයෝ දාලා, ප්‍රාදේශීය සභාවේ උප සභාපතිවරයෙක් මාලිමා ආණ්ඩුවේ, ඇවිල්ලා තජර්නය කරනවා.

"ඕගොල්ලෝ චොයිස් කට් දෙන්න එපා, ඕගොල්ලෝ මේ ප්‍රශ්න කතා කරන්න එපා" කියලා. ඉතින් මේ ප්‍රාදේශීය දේශපාලඥයෝ දාලා ප්‍රචණ්ඩත්වය මුදාහරිනවා මේ ගොවියන්ට එරෙහිව. ඉතින් මේකටනම් ලෑස්ති වෙන්න එපා. අපි විශ්වාස කරනවා, මේ ප්‍රශ්න කතා කරන ගොවි සංවිධාන වල නායකයෝ බහුතරයක්, ගොවි සංවිධාන, ඒ සාමාජිකයෝ, ගොවියෝ අතිබහුතරයක් ඡන්දය දුන්නේ මාලිමාවට.

ඒගොල්ලෝ අපේ මේ අපිට එකාබද්ධ විපක්ෂයේවත්, විපක්ෂයට සම්බන්ධ දේශපාලන පක්ෂවලවත් සාමාජිකයෝ නෙමෙයි. අපි කිසිම මැදිහත්වීමක් කරන්නේ නැහැ, ඒගොල්ලෝ ඒගොල්ලන්ගේ ප්‍රශ්න වෙනුවෙන් කතා කරන ස්වාධීන කාරණාවක තමයි ඉන්නේ.

අපි මේ කතා කරන්නේ රටේ මහජනතාව වෙනුවෙන්. විශේෂයෙන්ම ඒගොල්ලෝ රටට කියපු කාරණා තියෙනවා, ඒ කාරණා ඉෂ්ට කරගැනීම සඳහා තමයි අපි මේ එකතු වෙලා ඉන්නේ. ඒ නිසා මං හිතනවා, වතර්මාන ආණ්ඩුව අසමත් වෙමින් යනවා තමන් ලබාදීපු පොරොන්දු ඉෂ්ට කරගැනීම පිළිබඳව.

මේ මාධ්‍ය හමුවේදී නව ලංකා නිදහස් පක්ෂයේ භාණ්ඩාගාරික ශිරාස් යූනුස් මහතාද අදහස් දැක්විය.